# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1988 අංක 40 දරන
# ඔට්ටු ඇල්ලීම සහ සුදු බදු පනත

---

[සහතිකය සටහන් කළේ 1988 නොවැම්බර් මස 24 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

**1988 නොවැම්බර් මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.**

**ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.**

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

**මිල: ශත 60 යි** **තැපැල් ගාස්තුව: ශත 75 යි**

# 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම් සහ සූදු බදු පනත

[සහතිකය සටහන් කළේ 1988 නොවැම්බර් මස 24 වන දින]

**එල්. ඩී.—ඕ. 68/87.**

**බුකිකරුවකුගේ ව්‍යාපාරය හෝ සූදු ව්‍යාපාරය කරගෙන යන තැනැත්තන් විෂයෙහි වාර්ෂික බද්දක් නියම කිරීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය.**

**1.** මේ පනත 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**බද්ද නියම කිරීම.**

**2.** (1) වෙනත් යම් නීතියක කුමක් සඳහන් වුවද ඒ නොතකා සහ මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව, 1988 අප්‍රේල් මස 1 වන දිනෙන් ආරම්භ වන වර්ෂය සඳහා සහ ඉන් පසුව එළඹෙන සෑම වර්ෂයක් ම සඳහා, ශ්‍රී ලංකාව තුළ නීත්‍යනුකූල ව හෝ නීති විරෝධීව හෝ, ඒ වර්ෂය තුළ දී (කවර වූ හෝ කාල පරිච්ඡේද යක් සඳහා)—

(අ) බුකිකරුවකුගේ ව්‍යාපාරය ; හෝ

(ආ) සූදු ව්‍යාපාරය

කරගෙන යන සෑම තැනැත්තකු විෂයෙහි ම, මේ පනතේ උප ලේඛනයෙහි පිළිවෙලින් දක්වා ඇති අනුප්‍රමාණ අනුව (මෙහි මින් මතු 'බද්ද' යනුවෙන් සඳහන් කරනු ලබන) බද්දක් පනවා අය කර ගනු ලැබිය යුතු ය :

එසේ වුවද, (අ) හෝ (ආ) ඡේදයෙහි සඳහන් යම් ව්‍යාපාරයක් කරගෙන යෑම යම් වර්ෂයක ඔක්තෝබර් මස 1 වන දින හෝ ඉන් පසුව යම් තැනැත්තකු විසින් ආරම්භ කරනු ලැබූ අවස්ථාවක දී ඒ තැනැත්තා විසින් මේ පනත යටතේ ගෙවිය යුතු බද්දෙන් හරි අඩක් ඒ වර්ෂය සඳහා ගෙවීමට ඔහු යටත් වන්නේ ය.

(2) මේ වගන්තියෙහි සඳහන් යම් ව්‍යාපාරයක් නීතියෙන් තහනම් කරන ලැබූ ව්‍යාපාරයක් වන්නේ නම්, මේ වගන්තියේ ඉහතින් සඳහන් විධිවිධාන කිසිවකින් ඒ ව්‍යාපාරයට නීත්‍යනුකූල භාවය ප්‍රදානය කෙරෙන ලෙස ඒ විධිවිධාන තේරුම් නොගත යුතු ය.

**එක් එක් ස්ථානයෙහි කරනු ලබන ව්‍යාපාරය වෙන ම ව්‍යාපාරයක් වන බව.**

**3.** 2 වන වගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් සූදු ව්‍යාපාරයක් එක ම තැනැත්තකු විසින් විවිධ ස්ථානවල කරගෙන යනු ලබන අවස්ථාවක දී ඒ එක් එක් ස්ථානයෙහි වෙනම ව්‍යාපාරයක් ඔහු විසින් පවත්වාගෙන යනු ලබන්නේ යයි සලකනු ලැබිය යුතු අතර, ඒ එක් එක් ව්‍යාපාරය සඳහා බද්ද වෙන් වෙන්ව ගෙවීමට ඔහු යටත් විය යුතු ය.

**බද්ද ගෙවීම**

**4.** (1) මේ පනත යටතේ බද්ද ගෙවීමට යටත් තැනැත්තකු විසින් ඒ බද්ද පිළිවෙලින් ඒ වර්ෂයේ ජූලි, ඔක්තෝබර් සහ ජනවාරි යන මාසවල සහ ඊළඟ වර්ෂයේ අප්‍රේල් මාසයේ 15 වන දින හෝ ඊට පෙර සමාන වාරික හතරකින් කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවනු ලැබිය යුතු ය :

එසේ වුවද, 2 වන වගන්තියේ සඳහන් යම් ව්‍යාපාරයක් කර ගෙන යාම යම් වර්ෂයක අප්‍රේල් මස 1 වන දිනෙන් පසු ආරම්භ කරන යම් තැනැත්තකු විසින්, ඒ වර්ෂය සඳහා මේ පනත යටතේ ගෙවීමට ඔහු යටත් වන බද්ද, අවස්ථාගත කරුණු සැලකිල්ලට ගැනීමෙන් පසු සාධාරණ යයි කොමසාරිස් ජනරාල්වරයා විසින් සලකනු ලබන වාරික සංඛ්‍යාවකින් සහ එසේ සලකනු ලබන දිනවල දී ගෙවනු ලැබිය යුතු ය :

එසේම තවදුරටත්, 1988 ජූලි මස 15 වන දින හෝ එදිනට පෙර හෝ 1988 ඔක්තෝබර් මස 15 වන දින හෝ එදිනට පෙර බද්දේ යම් වාරිකයක් ගෙවීමට යටත් වන තැනැත්තකු මේ පනත ක්‍රියාත්මක වන දිනයෙන් පසු දින හැටක් ඇතුළත ඒ වාරිකය ගෙවනහොත්, ඒ වාරිකය ගෙවීම පැහැර හැර නැති ලෙස සලකනු ලැබිය යුතු ය. තවද ඔහු එකී දින හැට ඇතුළත ඒ වාරිකය ගෙවීම නොකළහොත් ඒ වාරිකය පැහැර හැර ඇති වාරිකයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, බද්දේ වාරිකයක් අයකර ගැනීම සම්බන්ධයෙන් ම මේ පනතේ විධිවිධාන ඒ වාරිකය අයකර ගැනීමට අදාළ විය යුතුය.

(2) මේ පනත යටතේ බද්ද ගෙවීමට යටත් වන යම් තැනැත්තකු (1) වන උපවගන්තියෙහි සඳහන් වන නැතහොත් ඒ යටතේ තීරණය කරනු ලබන දිනයේ දී හෝ ඊට පෙර යම් වාරිකයක් ගෙවීම පැහැර හරියහොත් ඒ වාරිකය පැහැර හැරී වාරිකයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, මේ පනතේ කාර්ය සඳහා ඒ තැනැත්තා ගෙවීම් පැහැර හැරී තැනැත්තකු සේ සලකනු ලැබිය යුතු ය.

(3) බද්දේ යම් වාරිකයක් පැහැර හැර ඇති අවස්ථාවක දී, එසේ පැහැර හැර ඇති වාරිකයට අමතර ව, දණ්ඩනයක් වශයෙන් පහත දැක්වෙන මුදල් ප්‍රමාණ ඒ පැහැර හැරී තැනැත්තා විසින් ගෙවනු ලැබිය යුතු ය :—

(අ) පැහැර හැර ඇති වාරිකයෙන් සියයට දහයකට සමාන මුදලක් ; සහ

(ආ) යම් වාරිකයක් පැහැර හැර ඇති වාරිකයක් වනුයේ යම් මාසයක දී ද ඒ මාසයට පසුව එළඹෙන මාසයේ 15 වන දිනට පෙර ඒ පැහැර හැරී වාරිකය නොගෙවනු ලැබුව හොත්, ඒ පැහැර හැරීම සිදු කර ගෙන යන එක් එක් අනාගාමී මාසයේ පසළොස්වන දින අවසාන කාලපරිච්ඡේදය සඳහා හෝ ඉන් කොටසක් සඳහා එකී වාරිකයෙන් සියයට දෙකකට සමාන වැඩිදුරටත් වූ මුදලක් :

එසේ වුවද මේ උපවගන්තිය යටතේ දණ්ඩනය වශයෙන් ගෙවිය යුතු මුළු මුදල පැහැර හැර ඇති වාරිකයෙන් සියයට පනහක් කිසිදු අවස්ථාවක දී නොඉක්මවිය යුතු අතර, පැහැර හැරීමට තුඩු දුන් යම් විශේෂ අවස්ථාගත කරුණු හේතු කොටගෙන දණ්ඩන මුදල කපා හැරීම හෝ අඩු කිරීම සාධාරණ සහ යුක්තිසහගත බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වන්නේ නම් ඒ මුදල කපා හැරීම හෝ අඩු කිරීම කරනු ලැබිය හැකි ය.

(4) පැහැර හැර ඇති යම් වාරිකයක් මේ වගන්තියේ (3) වන උපවගන්තියේ සඳහන් දණ්ඩනය ද සමග පැහැර හැරි තැනැත්තා ගෙන් අයකර ගනු ලැබිය හැකි ය.

(5) ව්‍යාපාර පිරිවැටුම් බදු පනතේ XI සහ XII වන පරිච්ඡේද වල සහ 40, 41, 42, 43 සහ 57 වන වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව මේ පනත යටතේ ගෙවිය යුතු බද්දේ යම් වාරිකයක් ගෙවීම හෝ අයකර ගැනීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

5. (1) පහත සඳහන්, එනම්,— වැරදි.

(අ) මේ පනතේ 4(5) වන වගන්තිය සමග කියවිය යුතු ව්‍යාපාර පිරිවැටුම් බදු පනතේ 38 වන වගන්තිය යටතේ පනවා ඇති යම් නියමයකට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින;

(ආ) තමන් බද්දට යටත්වීම හෝ වෙනත් යම් තැනැත්තකු බද්දට යටත්වීම කෙරෙහි බලපාන ලෙස අසත්‍ය තොරතුරු ඕනෑකමින් සපයන;

(ඇ) මේ පනතේ 4(5) වන වගන්තිය සමග කියවිය යුතු ව්‍යාපාර පිරිවැටුම් බදු පනතේ 42 වන වගන්තිය හෝ 43 වන වගන්තිය මගින් හෝ ඒ යටතේ කොමසාරිස් ජනරාල් වරයා වෙත හෝ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු වෙත පවරා ඇති බලතල කිසිවක් ක්‍රියාත්මක කිරීමෙහිලා කොමසාරිස් ජනරාල්වරයාට හෝ එවැනි නිලධරයකුට ඕනෑකමින් විරෝධය පාන හෝ අවහිර කරන;

(ඈ) මේ පනතේ 4 (5) වන වගන්තිය සමග කියවිය යුතු ව්‍යාපාර පිරිවැටුම් බදු පනතේ 57 වන වගන්තිය යටතේ දිවුරුමක් දීමට නියම කර ඇති තැනැත්තකු ව සිටිමින් ඒ දිවුරුම නොදී මේ පනත යටතේ ක්‍රියාකරන; හෝ

(ඉ) මේ පනතේ 4(5) වන වගන්තිය සමග කියවිය යුතු ව්‍යාපාර පිරිවැටුම් බදු පනතේ 57 වන වගන්තියේ විධිවිධාන කඩ කරන

සෑම තැනැත්තකු ම මේ පනත යටතේ වරදක් සම්බන්ධයෙන් වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන නඩු විභාගයක දී වරදකරු කරනු ලැබුවහොත් රුපියල් දස දහසකට නොවැඩි දඩයකට හෝ එක් වර්ෂයකට නොවැඩි කාලයක් දෙයාකාර යෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ ඔහු යටත් වන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ යම් වරදක් කරන ලද්දේ යම් විශේෂ අවස්ථාගත කරුණු යටතේ බවටත් ඒ වරද සමථයකට පත් කිරීම සාධාරණ සහ යුක්ති සහගත වන බවටත් කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත් වන්නේ නම් කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ වරද සමථයකට පත් කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් කවර වූ හෝ අධිකරණයක නඩු පැවරීමක්, කොමසාරිස් ජනරාල් වරයාගේ අනුමැතිය ඇතිව මිස නොකරනු ලැබිය යුතු ය.

කාර්ය පරිපාලනය.

6. (1) කොමසාරිස් ජනරාල්වරයා මේ පනත පිළිබඳ කාර්ය පරිපාලනය භාරව සිටිය යුතු ය.

(2) මේ පනතින් කොමසාරිස් ජනරාල්වරයා වෙත පිරිනමා ඇති හෝ වෙන්කොට දී ඇති බලතල හෝ කර්තව්‍ය කිසිවක් ඔහු විසින් ලියවිල්ලක් මගින් යම් නියෝජ්‍ය කොමසාරිස්වරයකු වෙත හෝ තක්සේරුකරුවකු වෙත පවරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ යම් බලයක් හෝ කර්තව්‍යයක් පවරනු ලැබූ සෑම නියෝජ්‍ය කොමසාරිස්වරයකු හෝ තක්සේරුකරුවකු විසින්, කොමසාරිස් ජනරාල්වරයාගේ විධාන වලට යටත්ව ඒ බලතල ක්‍රියාත්මක කිරීම හෝ කර්තව්‍ය ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

(4) මේ පනත යටතේ කොමසාරිස් ජනරාල්වරයාගේ බලතල ක්‍රියාත්මක කරන හෝ කර්තව්‍ය ඉටු කරන නියෝජ්‍ය කොමසාරිස්වරයකු හෝ තක්සේරුකරුවකු වෙත ඒ බලතල ක්‍රියාත්මක කිරීම හෝ කර්තව්‍ය ඉටු කිරීම සඳහා බලය දී ඇති බව, ප්‍රතිවිරුද්ධව කරුණු ඔප්පු කරනු ලබන තෙක්, සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

7. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ පනතේ—

"තක්සේරුකරු", "කොමසාරිස් ජනරාල්වරයා", "නියෝජ්‍ය කොමසාරිස්වරයා" සහ "තැනැත්තන්" යන යෙදුම්වලට ඒවාට පිළිවෙළින් ව්‍යාපාර පිරිවැටුම් බදු පනතේ 50 වන වගන්තියෙන් දී ඇති අර්ථම ඇත්තේ ය.

"බුකිකරු" යන්නෙන් ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත පවත්වනු ලබන හෝ පැවැත්වීමට යෝජනා කරනු ලබන තුරඟ තරඟ සඳහා

(අ) කෙළින්ම හෝ අන්‍යාකාරයකින් ;

(ආ) මුදලට හෝ ණයට

ඔට්ටු භාරගන්නා වූ හෝ ඒ පිළිබඳ කටයුතු කරන්නා වූ තැනැත්තකු අදහස් වේ ;

"ව්‍යාපාරය" යන්නෙන් 2 වන වගන්තියේ (අ) ඡේදයේ හෝ (ආ) ඡේදයේ සඳහන් යම් ව්‍යාපාරයක් අදහස් වන අතර, ඒ සමාන රක්ෂාවක් හෝ, යම් සමාජ ශාලාවක සාමාජිකයන් අතර ඇති කරගනු ලබන ඒ සමාන ස්වභාවයක ගණුදෙනු ඊට ඇතුළත් වේ.

“සූදු” යන්නෙන් ඔට්ටුවක් සඳහා යම් ක්‍රීඩාවක් කිරීම අදහස් කෙරෙන අතර බකාරා, පුන්ටෝ බැංකෝ, බිග් සික්ස්, බ්ලැක් ජැක්, බුවලේ, චෙමින් ඩිපර්, චක් අ ලක්, ක්‍රවුන් ඇන්ඩ් ඇන්කර්, පාරෝ, පාරෝ බෑන්ක්, හසාඩ්, පෝකර් ඩයිස්, පොන්ටූන්, ඇමෙරිකානු හෝ ප්‍රංශ රූලේ, ට්‍රෙන්ටේ එට් ක්වොරන්ටේ, විංග්-එට්-උම්, වීල් ඔෆ් ෆෝචූන් යන කවර වූ හෝ ක්‍රීඩාවක්—

(අ) ගෙවීමක් කර හෝ නොකර ; නැතහොත්

(ආ) අයිතිවාසිකමක් මත හෝ එසේ නැතිව

පුද්ගලයන්ට ඇතුළු විය හැකි යම් ස්ථානයක පවත්වාගෙන යෑම ඊට ඇතුළත් වේ ;

“ව්‍යාපාර පිරිවැටුම් බදු පනත” යන්නෙන් 1981 අංක 69 දරන ව්‍යාපාර පිරිවැටුම් බදු පනත අදහස් වේ ;

“වර්ෂය” යන්නෙන් යම් වර්ෂයක අප්‍රේල් මස 1 වන දිනෙන් ආරම්භ වී ඉක්බිතිව ම එළඹෙන වර්ෂයේ මාර්තු මස 31 වන දිනෙන් අවසාන වන මාස 12 ක කාලච්ඡේදය අදහස් වේ.

## උපලේඛනය

(2 වන වගන්තිය)

### 1-අ කොටස

1988 අප්‍රේල් මස 1 වන දිනෙන් ආරම්භ වන වර්ෂය සඳහා සහ ඉක්බිතිව ම එළඹෙන එක් එක් වර්ෂය සඳහා බුකිකරුවකු වශයෙන් ව්‍යාපාරය කරගෙන යන්නා වූ තැනැත්තකු විසින් ගෙවනු ලැබිය යුතු බද්ද රුපියල් එක් ලක්ෂයක් වේ.

### 1-ආ කොටස

1988 අප්‍රේල් මස 1 වන දිනෙන් ආරම්භ වන වර්ෂය සඳහා සහ ඉක්බිතිව ම එළඹෙන එක් එක් වර්ෂය සඳහා, සූදු ව්‍යාපාරය කරගෙන යන තැනැත්තකු විසින් ගෙවිය යුතු බද්ද රුපියල් දස ලක්ෂයක් වේ.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 177 කි. (විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.